# නිර්මාණ Nirmana

## සිංහල අළුත් අවුරුද්ද එයි !

කොහාගෙ ගී හඬ ඇහුණම අවුරුදු එනවා
සිරිත් විරිත් ගරු කරන්න අවුරුදු එනවා
නොනගතයට පන්සල් යන මගට බහිනවා
නාමල් වට්ටිය පුදලා බුදුන් වඳිනවා

ගෙයක් ගානෙ තෙල් තාච්චි ලිප උඩ නැතු වට
කැවුම් කොකිස් අතිරස කිරිබත් යයි මේ සෙට
රට පුරාම එක මෙහොතක කිරිබත් කන කොට
සියළු දෙවියො රැකදෙනවා ඇත මගෙ මව් රට!

අළුත් ඇඳුම් තෑගි බෝග පැණිරස මල්ල
ආදරයෙන් අරන් ඒවි අම්මට කෙල්ල
තාත්තටත් ගෙදර හැමට සිත සැන සිල්ල
සුබ නැකතට තියෙනව හිස තෙල් ගැල් විල්ල

තරහ මරහ වාද බේද දුරුකර ගන්න
නෑදෑයෝ වැඩිහිටියෝ බැහැ දැක ගන්න
බුලත් අතක් දී වැඳ ආසිරි ලැබ ගන්න
සිංහළ අවුරුද්ද හොඳින් ගතකර ගන්න!

♦ ප්‍රේමා සුරවීර රූපසිංහ
නුගේගොඩ Sri Lanka



## සිංහල අවුරුදු

අවුරුදු උදා නය
ගෙන දෙයි නව නිදා නය
නැකතයි විධා නය
එයින් සතුටයි සමගි දානය

දෙමා පිය සොහො යුරු
නැන්ද මාමා සුමි තුරු
නංගි මල්ලී විරු
සෙත සදාලයි සැම පිවි තුරු

නැකම් සදා ලයි
හිත් අමනාප දුර ලයි
නව හැඟුම් පුබු දයි
හිතේ සතුටයි කිරිද උතු රයි

නෙතට නෙත ගැටුමේ
නැකම වේය අරුමේ
හෙට දිනක උරුමේ
වේය සිතකට සතුට පිරුමේ

තුන් සරණ වේවා!
දෙවි රැකවරණ දේවා!
හැම දුක් නිවේවා!
සිත්සතන් ඉන් පහන් වේවා!

♦ සුමනා අබේසිංහ
ශ්‍රීලංකා ගුවන්විදුලි සංස්ථාව
Colombo 7, Sri Lanka

❊ ❊ ❊ ❊ ❊ ❊

## සිහිනයක්(ම) වූ සිහින සිත්තම

ඉදුසමුවෙ සත් මහිම ගලපා
පුර හඳේ රන්කිරණ හා
ස්නේහයේ අරුමය කියා දුන්
සිහින සිත්තම බොඳ වුණා

පිපෙන්නට පෙර සුවඳ විදහා
මිහිරි හඬ ඇදි රේඛා සොබා
හද විමන් දොරකඩ සතපවා
සිහින සිත්තම දුර ගියා

අහස් කුස දුර දිලෙන තරුවල
මිරිඟු දිය සඟවා තබා
වසන්තය හද ළඟට ගෙනැවිත්
සිහින සිත්තම ගොළුවුණා

ළවැලි මත ඇති මතක සළකුණු
දරා සිටියත් සැඩ සුළං නැගෙනා
සිනහකැන් අකා මකා සැහැසිව
සිහින සිත්තම නික්මුණා

සිතිජ ඉම්වල සිතුම්ණි සඟවා
දුකඳුළු දස අත විසිරුවා
හද පවුරක රූ කැටයම් කොට ඒ
සිහින සිත්තම ගිලිහුණා

♦ එරංගා පෙරේරා
නෙදර්ලන්තය Netherlands

## අවුරුද්දයි ! ගමයි !

රතුපාටට එරබදු මල් සේල එලෙන් නේ
කොවුල් ගීත නාදය සවනට රස දෙන් නේ
කැවුම් කොකිස් සුවඳයි දස අත පැතිරෙන් නේ
අවුරුදු සිරියාවෙන් මුලු ගම එළි වෙන් නේ

ඔන්චිලි විලි විලි ඔන්චිල්ලා උඩ යන් නේ
පංචි කෙළිය ඔලිඳ කෙළිය බාල ලමුන් නේ
නැකතට සිරිතට නිරතුරු මුල් තැන දෙන් නේ
කඳ මලු බැඳ සතුටු සිතින් නෑගම් යන් නේ

ගම එළිවන අවුරුදු සිරි කවුද නොදන් නේ
අවුරුද්දට ගමටයි ඉගිලෙන්න හිතෙන් නේ
එහෙම ගමක් දැන් නැති බව සැවොම කියන් නේ
කොහේ නැතත් ඒ ගම මගෙ හිතේ තියෙන් නේ

♦ ශ්‍රීපාලි කොටුවැල්ල
Arleta, California USA

## නිදියන මුණුපුරාට

අත් මිටි මොළව ගත් දෙපසට දිගු කෙරුණ
නෙත් පියවා අඩක් මල් කැකුළක් ලෙසින
හොත් පිළිමයක් සේ වැතිරී මත යහන
සිත් කලු සිහින දැක සිනැහෙනවද පුතුන

කුස ගිනි දැනෙන තුරු නිදියන බිළිඳු පුතේ
රස කිරි දැනෙනවද සිහිනෙන් දෙතොල මතේ
බස තවමත් නුහුරු සිතුවිලි නුඹගෙ සිතේ
හස රැළි කඳුළු ලෙස පෙරළී දිසෙයි වතේ

විමසන සියළු දෙය හැර නුඹෙ නිල් නයන
හසුවන සැම බිළිඳු දැතට මුවට ගෙන
දෙසවන වැකි හඬට යොමු කර කර උවන
සැරසෙන වද විඳින්නට මතු දිවි සටන

සැණෙකින අවදි වුණ පෙරළී මුනින් අත
නගමින බිළිඳු බස් මුවගින් යහන මත
දිසිවන විටදි සිටගන්නට කරන තැත
නැග එන සිනා සරසයි අප හැමගෙ වත

ඇති දැඩි වී තරුණයෙකු වී කලෙක මතු
නැති කොට බොළඳ ගති අදහස් නැණින් යුතු
නිතියෙන දැහැමි දිවියක් නුඹ කළොත් සතු
දෙති දෙවියෝ පවා ආසිරි නුඹට පුතු!

♦ වෛද්‍ය උපාලි අබේසිරි
Middx UK

## අවුරුදු මිහිර

කළඑළි වෙද්දි නගරය ගම සහ බැද්ද
පැතිරෙනු පෙනේ ගෙන්ගෙට මල් වෙඩි සද්ද
කුලදේවතා පිදුමෙන් වී පිරි සුද්ද
සාමය සතුට මැද පැමිණෙයි අවු රුද්ද

අටු කොටු පිරී ඉතිරී හැම ගෙදර කම
අඹ දඹ රඹ දොඩම් බරවෙයි ගසක හැම
පොබ කොට සිත් සතන් දරුවන්සමග තම
කාබී සතුටු වෙති ගැමියෝ සිහල බිම

රැකගෙන කුල සිරිත් හෙළයන් පරිදි හොඳ
සතුටින් සමගියෙන් අවුරුදු සිරිය විඳ
පුද දී බුලත් අත වැඩිහිටි දෙගුරු වැඳ
කිරිබත් කැවුම් අලුවා කන දවස අද

♦ හල්තොට පී. මාතරආරච්චි
Sri Lanka

## පුවත්පතක පහළොස් වසර !

අපගෙ පුවත්පතකට
පහළොස් වසර ගෙවුණට
සිතේ ඇතිවුණ සතුටට
සිතුණා මෙසේ ලියුමට

අනාගතයෙදි එය
නව අරුත් සමගින්
දැක්මට ලොබ සිතින්
සිටිනා කෙනෙක් වෙමි මම්!

කතුතුමා ඇතුළු
කාරිය මඬුල් ලට
ලැබෙවා දිරිය එහි
දිගු කල් පැවැත් මට
කළ සේවය තුටින්
ඉමහත් අගේ කොට
සුබ පැතුමක් එවමි
ලංකා විත්ති යට!

♦ සරත් සිල්වා
Manor Park, London E12

## හද බැඳගත්ති - ලංකාවිත්ති

නොමින් වසර පසළොස් නොසැලී දිගට
නැණින් සුවඳ පතුරා ලොව දස අතට
නිතින් උතුම් දෙස බස රැකගත් පිනට
ඉතින් සිහළ ජාතිය ණයගැති නුඹට!

සාහිත කවි කතා රට තොට හා බැඳුණ
සීමිත වුවත් ඉඩකඩ නිසි ලෙස පිරුණ
මාවත රළු නමුදු අත් නොහැරම රැඳුණ
මීවිත ලෙසින් දකිනෙමු නැණ ගුණ වරුණ!

රූසිරි සපිරි නැවණැස දැල්වූ ඇත්තී
පෑසිරි පියෙන් පිය නැග දියුණුව දත්තී
සීගිරි කවක රසයෙන් හද බැඳ ගත්තී
ආසිරි පතමි ඔබ හට ලංකා විත්තී!

♦ පද්මා කුරුප්පු
Paris France

## වාසනාවන් ලංකාවිත්ති !

දහසක් කම්කටොළු ආවද පෙර මුණට
ඒ හැම අබිබවා නොනැවත ගොස් පෙරට
ලංකාවිත්ති පිවිසෙන පහළොස් වසට
කළ සේවය නැගෙයි අද මහමෙර උසට

මුලු ලොව ඔබේ කාහල පණිවුඩය නැගේ
වෙන පත් රජිදෙකුට මෙය කළ නොහැක හැගේ
නැණ බල වියත්බව පා ඔබ ඉදිරි මගේ
පහළොස් වසක් ලෙලදුනි ජය කොඩිය වගේ

නිම කළ නොහැකි කරදර කඳු හෙල් ආදී
අවහිර අවකැපුම් ඉසි කෝ බල සෑදී
ඔබ වෙත කොතෙක් ආවත් එකි නෙක ඇදී
ඒවා විසුණු විය ජයමාවත පෑදී

මැද පිළිවෙත අනුව එය අඩු වැඩි නොකොට
හෙළ බස හෙළ වහර ලෙළවා යස රහට
සාහිත සයුරෙ පිහිණන නයුවෙකු ලෙසට
ලංකාවිත්ති පහනකි දැල්වෙන දැයට

පුපුරා විසිරුවත් උවදුරු එක පෙළට
සපුරා නියම මහ හෙළිකළ අප දනට
වපුරා සිහළකම ගිය පහළොස් වසට
මිතුරා ඔබය, ඔබ රැකගත යුතු හෙටට

විහිදා නැණ නුවණ විලසින් මනාවන්
සිහියට නගන හොඳ හොඳ කල් පනාවන්
කාහට කියන්නද? අප උව මනාවන්
ලංකා විත්ති සැමදා වාසනාවන්!

♦ කරුණා බස්නායක
Hampstead, London

## හෙළ පුවත්පත් කුමරියට

පහළොස් වසර සපුරණ මේ පත් කුමරී
මුදු බස් වහරකින් අප අමතන සොයුරී
නැත දොස් දකින්නට ඇය හොඳ මිස සපිරී
සහතොස් සිතින් අපි පතනෙමු දිගා සිරී!

♦ හෙක්ටර් සහ මාලිනී Edgware Middx

## දිගුකල් වාසනාවන් ලංකාවිත්ති !

කරුණා, දයා, මෙත් ගුණකඳ ඉවත නොලා
හිනැහී යොවුන් දොරකඩ මිණි කිකිණි සලා
සුකොමළ මුව කමල සැම සිත් පුබුදු කළා
මම ඔබ වැළඳගමි! ආදර පළස එළා

දන මන රැඳුණු මිසදිටු ගන අඳුර ඉරා
හිරු දුටු වසත් කුමරිය වී සෙනෙහෙ පුරා
පහළොස් වසක් හෙළ සුවඳක මිහිර පෙරා
නුඹ කළ මෙහෙය අමිලය දිවි තිබෙන තුරා

සිව් කොණ සිහළ පරපුර අබිමන රකි මින්
හෙළ කුල කුමරියකගේ කිතුගොස නග මින්
බාදක හෙළා දිරියේ මාවත සද මින්
පා යුග තබනු පෙරටම තුටු දිය බෙද මින්

ජන හද බැඳුණු සෙනෙහෙන් සවි ලැබ ගත්තී
තෙරුවන් බෙලෙන් සැප බල ආයුස ඇත්තී
සිත් මල සතුට මිස රුදු ගතිගුණ නැත්තී
දිගුකල් වාසනාවන් ලංකා විත්තී!

♦ දුලාංජලී සිරිවර්ධන
පානදුර Sri Lanka

## ලංකා විත්ති සැරදේ !

පහළොස් වසරකට පෙරදී මුල පුරලා
ලංකාවිත්ති හෙළ හදවත් ඔප කරලා
තොරතුරු ලක්බිමේ ලොව හැමතැන බෙදලා
රසවත් හැඟුම් ලේඛකයන් පණ පොවලා

කළ සේවය අගෙයි වැනුමට වචන නැත
කවියන් කිවිඳියන් බිහිකළ දෙමින් අත
මීවදයක් වගේ රසවත් ගතිය ඇත
නොමිළේ බෙදා දෙයි පත ලොව හතර අත

හදතුළ සොම්නසක් සඟවා අගේ ඇතී
හෙළබස ලොව පුරා පතුරා වඩා තුතී
මේ වගෙ වැඩ කරන මිනිසුන් ලොවේ නැතී
දයා ආනන්ද අගයමු ඔබේ ගතී

තව බෝ කලක් ලංකා විත්ති දින දින
වැඩිවීමෙන් අගය ලොව පුරා දුව යන
හෙළ බස රකින කාගෙත් සවිය අර ගෙන
වැජඹේවා! බොහෝ කල් මිහිර බෙද මින

♦ ප්‍රේමා සුරවීර රූපසිංහ
නුගේගොඩ Sri Lanka

## ලංකා විත්තියට සෙත් පතමි!

සිටිනා සියළු දෙන දස අත රටින් රට
දෙයි රස මිහිරි තොරතුරු ලක්විත්ති යට
මෙපමණ කලක් කළ සේවය අගේ කොට
පතනෙමු දිගාසිරි කතුවර දයාට

හෙළ බස් හසුරුවා නිසි පියකරු ලෙසට
සේවය අගෙයි කරනා ලන්ඩන් වලට
ඔබ පින් කඳකි යුතුකම් දන්නා යසට
තුති පුද දෙමු නමමු අපි හිස ඔබ නමට

ඔබ වැනි පුතෙකු බිහි කළ මව පින්වත් ය
දෙස බස රකින්නට අදිටන වැදගත් ය
දක්වන ඇල්ම උත්සාහය ඉමහත් ය
ඔබ සහ පුවත්පත යහතින් සැරදෙත් ය!

♦ රත්නාවලි කුමාරි දිසානායක
Hounslow Middx UK

## මල්බර වියට එළඹෙයි ලංකාවිත්ති

මසකට වරක් අරගෙන අප රට විත්තී
පහළොස් වසරක්ම ගෙදරට ආ ඇත්තී
පිටරට සිටින හෙළයන්ගේ සිත් ගත්තී
මල්බර වියට එළඹෙයි ලංකා විත්තී

සිංහළ අපට සිංහළකම මෙයයි කියා
කිවයුතු දේ තේරෙන සිංහළෙන් කියා
කඩුවට වඩා පෑනක මුවහතක් තියා
වීර කාලයක් වැජඹේවා සමග දයා!

♦ සුනිල් පෙරේරා
Skegness - Lincolnshire - UK

## තුන් හෙළ මංගල්‍යය

සළකුණු මැකීගොස් සිත් තුළ ළතැවිල්ලේ
රඳවා සෙනෙහසට මුව අග හසරැල්ලේ
ගෙවෙනා මිහිරි සුබ දිනයකි සැනසිල්ලේ
මෙයවේ ඉතින් තුන් හෙළයේ මංගල්ලේ
නෑසියො සැවොම එක දජයක සෙවන යට
වැජඹෙති මෙවර නව අවුරුදු ලබන විට
ළිප ගිනි මොළවමින් හැම එක නැකත කට
කිරි බත් පිස සුවඳ පතුරමු හැම අතට

♦ චන්ද්‍රා රෝහිණී කැටිපෙආරච්චි
ඇල්පිටිය Sri Lanka